# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

ශ්‍රී ලංකා ආර්ථිකය, 2017 වසරේ දී වාර්තා කළ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ දී, දේශීය මෙන්ම විදේශීය වශයෙන් වන අභියෝග මධ්‍යයේ සියයට 4.0 ක වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිල සංඛ්‍යා දත්ත අනුව ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 3.6 ක ආර්ථික වර්ධන වේගයක් වාර්තා කරන ලදී. කෘෂිකාර්මික කටයුතු යථා තත්ත්වයට පත්වීම මෙන්ම සේවා කටයුතුවල සිදු වූ ප්‍රගතිය ද ආර්ථික වර්ධනය කෙරෙහි හිතකර ලෙස දායක වූ අතර, කර්මාන්ත කටයුතුවල ඇතිවූ පසුබෑම ආර්ථිකයේ සමස්ත වර්ධනය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරන ලදී. සේවා කටයුතුවල දක්නට ලැබුණු වර්ධනය කෙරෙහි, ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා සහ වෙළඳාම් කටයුතුවල වර්ධනය දායක වූ අතර, වී, එළවළු, ධාන්‍ය සහ පලතුරු වගාවන් යථා තත්ත්වයට පත්වීම, කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් විය. කෙසේ වුවද, කර්මාන්ත කටයුතුවල වර්ධනය මන්දගාමී වීම කෙරෙහි ඉදිකිරීම් කටයුතුවල දක්නට ලැබුණු පසුබෑම ප්‍රධාන වශයෙන් ම හේතු විය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යෑම, ප්‍රතිපත්තිවල දක්නට ලැබුණු අවිනිශ්චිතභාවය හේතුවෙන් ව්‍යාපාර තීරණ කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීම මෙන්ම පෙර වසරේ දී පැවැති දැඩි මුදල් ප්‍රතිපත්තියෙහි පසුකාලීන බලපෑම මෙම කාලසීමාව තුළදී ආර්ථික වර්ධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. ප්‍රමුඛ පෙළේ රටවල් සමඟ වන ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් මෙන්ම ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව ඉහළ නැංවීම, වඩාත් ඉලක්කගත ආයෝජන ප්‍රවර්ධනය, වෙළෙඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම, සාධක වෙළඳපොල සංශෝධන සඳහා පියවර ගැනීම සහ ප්‍රතිපත්තිමය වශයෙන් සිදුවන අනෙකුත් හිතකර වර්ධනයන් තුළින් ද ආර්ථිකය ඉදිරියේදී ප්‍රතිලාභ ලබනු ඇත. කෙසේ වුවද, ගෝලීය වෙළඳපොළෙහි විශේෂයෙන් බොරතෙල් ඇතුළුව භාණ්ඩ මිල ඉහළ යෑම, ප්‍රධාන වෙළඳ පාර්ශ්වකාර රටවල දක්නට ලැබෙන භූ දේශපාලනික අවිනිශ්චිතතා සහ විදේශීය වශයෙන් එල්ලවිය හැකි වෙනත් කම්පනයන්, දැඩි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මෙන්ම අනපේක්ෂිත අහිතකර කාලගුණික තත්ත්වයන් ආර්ථිකය අපේක්ෂිත වර්ධනය කරා ළඟාවීම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.

2

## 2018 වසරේ ප්‍රවණතා


### නිෂ්පාදිතය

- ශ්‍රී ලංකා ආර්ථිකය, 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 3.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහිදී, සේවා සහ කෘෂිකාර්මික කටයුතු පිළිවෙළින්, සියයට 4.8 ක හා සියයට 4.9 ක වර්ධනයන් වාර්තා කරන ලද අතර, කර්මාන්ත කටයුතු සියයට 1.6 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, වෙළඳාම් කටයුතු, වෙනත් පෞද්ගලික සේවා සහ දේපළ වෙළඳාම් කටයුතුවල වර්ධනය දායක විය. මේ අතර, වී, එළවළු සහ ධාන්‍ය වගාවන් යථා තත්ත්වයට පත්වීම මෙන්ම පලතුරු වගාව, සත්ත්ව නිෂ්පාදන, ධීවර කටයුතු, කුළුබඩු භෝග වගාව සහ වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදනවල දක්නට ලැබුණු හිතකර වර්ධනය ද කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා දායක විය. කෙසේ වුවද, නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණ ද ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල ඇති වූ පසුබෑම හේතුවෙන් කර්මාන්ත කටයුතුවල අඩු වර්ධනයක් දක්නට ලැබුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ සිදුකරන ලද පුරෝකථනවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වසරේ දී වාර්තා කළ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව, 2018 වසරේ දී සියයට 4.0 ක වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අපේක්ෂිත වාර්ෂික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සේවා සහ කෘෂිකාර්මික කටයුතු දායක වනු ඇතැයි අපේක්ෂා කරන අතර, කර්මාන්ත කටයුතුවල යම් මන්දගාමීත්වයක් අපේක්ෂා කෙරේ. මූල්‍ය සේවා කටයුතුවල දක්නට ලැබෙන අඛණ්ඩ වර්ධනය සහ තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතුවල වර්ධනය මෙන්ම සංචාරක කටයුතු ඉහළ යෑමත් සමග නවාතැන් සැපයීම ආශ්‍රිත සේවා කටයුතු වර්ධනය වීමද, සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2.2 රූප සටහන**

**කාර්තුමය ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)**





(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2.1 රූප සටහන**

**දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) - 2018 පළමු භාගය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

එමෙන්ම, කෘෂිකාර්මික කටයුතුවල දක්නට ලැබුණු යහපත් ප්‍රවණතාව සමස්ත ආර්ථික වර්ධනයට ධනාත්මකව දායක වෙමින්, වසරේ ඉදිරි කාලය තුළදී ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර සිමෙන්ති උපයෝජ්‍යතාවය සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය වැනි දර්ශක මගින්ද පිළිබිඹු වන පරිදි ඉදිකිරීම් කටයුතුවල මෑතකාලීනව දක්නට ලැබුණු පසුබෑම, කර්මාන්ත කටයුතු මන්දගාමී වීමට ප්‍රධාන වශයෙන් හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, රෙදිපිළි සහ නිමි ඇඳුම් නිෂ්පාදනයේ වර්ධනය සහ කෘෂිකාර්මික කටයුතු නැවත යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු වර්ධනය වනු ඇති අතර එය නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල ක්‍රියාකාරිත්වය කෙරෙහි මෙන්ම සමස්ත කර්මාන්ත කටයුතු සඳහා ධනාත්මකව දායකවනු ඇත. ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් අනාවරණය වූ පරිදි, වසරේ දෙවන භාගයේ මුල සිට ආර්ථිකයේ සමස්ත ඉල්ලුමේ සහ නිෂ්පාදනයේ වර්ධනයක් අපේක්ෂා කෙරේ. එමෙන්ම, සේවා කටයුතු සඳහා ගණනය කරනු ලබන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සැප්තැම්බර් මාසයට අදාළ දත්ත අනුව ඉදිරි මාස තුන තුළ සේවා කටයුතුවල යම් යහපත් වර්ධනයක් අපේක්ෂා කෙරේ. තවද, නිෂ්පාදන කර්මාන්ත කටයුතු සඳහා ගණනය කරනු ලබන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ ද සැප්තැම්බර් මාසයට අදාළ දත්ත අනුව ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන කර්මාන්ත කටයුතු පිළිබඳ අපේක්ෂා යහපත් බව පෙන්නුම් කෙරේ. එසේ වුවද, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවයන් මෙන්ම පවත්නා ආර්ථික වාතාවරණය ද සිය ව්‍යාපාර තීරණ කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව සමීක්ෂණයට සහභාගිවන්නන් විසින් සඳහන් කරන ලදී.

- **දේශීය මෙන්ම විදේශීය වශයෙන් පැන නැගිය හැකි අභියෝග හේතුවෙන් 2018 වසරේ ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා පහත වැටීමේ යම් අවදානමක් ඇත.** ලෝක වෙළඳපොළේ පවතින බොරතෙල් මිල ඉහළයෑමේ ප්‍රවණතාව හේතුවෙන් දේශීය බලශක්ති වියදම වැඩිවීමත් සමගම නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් සහ ප්‍රවාහන සේවා වැනි දේශීය කර්මාන්තවල යෙදවුම් පිරිවැය ඉහළ යා හැකිය. තවද, විශේෂයෙන්ම ඉරානය ඇතුළු මැදපෙරදිග කලාපයේ සහ අනෙකුත් ප්‍රධාන වෙළඳ පාර්ශ්වකාර රටවල පවත්නා භූ දේශපාලනික අවිනිශ්චිතතා රටෙහි අපනයන කෙරෙහි බලපෑම් ඇති කළ හැක. එමෙන්ම, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය මෙන්ම යුරෝපා කලාපය තුළ පවතින දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ද රටෙහි විදේශ ඉල්ලුම කෙරෙහි බලපෑම් ඇති කළ හැක. එසේම, අනපේක්ෂිත අයහපත් කාලගුණික තත්ත්ව ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල වර්ධනයට අයහපත් ලෙස බලපාමින් සමස්ත කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය අඩාල කිරීමට හේතු විය හැකි අතර, එය කෘෂිකාර්මික කටයුතු හා බැඳුණු ආහාර සකස් කිරීම ඇතුළු නිෂ්පාදන කර්මාන්ත කටයුතු මෙන්ම වෙළඳාම සහ ප්‍රවාහනය වැනි සේවා ආශ්‍රිත කටයුතු කෙරෙහි ද අහිතකර ලෙස බලපෑ හැකිය.

## ආර්ථික කටයුතුවල වර්ධනය

### කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය

- **කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කටයුතුවල එකතු කළ අගය, 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද සියයට 3.8 ක පහත වැටීමට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී යථා තත්ත්වයට පත්වෙමින් සියයට 4.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** මේ සඳහා වී, එළවළු සහ ධාන්‍ය වගාවන්හි එකතු කළ අගය පිළිවෙළින් සියයට 58.2 කින්, සියයට 14.8 කින් සහ සියයට 38.1 කින් වර්ධනය වීම විශාල වශයෙන් දායක විය. තවද, පලතුරු වගාව, සත්ත්ව නිෂ්පාදන, ධීවර කටයුතු, කුළුබඩු භෝග වගාව සහ වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන යන ආර්ථික කටයුතුවල එකතු කළ අගයන්හි සිදු වූ යහපත් වර්ධනය ද කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා ධනාත්මකව දායක විය. කෙසේ වුවද, පසුගිය වසරේ පැවැති වියළි කාලගුණික තත්ත්වයේ දීර්ඝකාලීන බලපෑම හේතුවෙන් මෙම කාලපරිච්ඡේදයේදී තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) සියයට 4.6 කින් පහත වැටුණි. තවද, කෘෂිකාර්මික කටයුතුවල යහපත් ප්‍රවණතාවයට යම්තාක් දුරකට බාධා ඇති කරමින් රබර් වගාව, වෙනත් බහුවාර්ෂික භෝග වගාව සහ උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග වගාවන්හි එකතු කළ අගය මෙම වසරේ පළමු භාගයේ දී පහත වැටුණි.

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: කෘෂිකර්මය

### කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

2

- කෘෂිකාර්මික හා ධීවර කටයුතුවල නිමැවුම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය 2018 පළමු භාගයේ දී සියයට 13.3 ක වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් පැවති හිතකර කාලගුණික තත්ත්වය හා වගා කළ භූමි ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් වී උප අංශය සියයට 62.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. පශු සම්පත් හා වෙනත් භෝග (පලතුරු, එළවළු හා වෙනත් ක්ෂේත්‍ර භෝග) උප දර්ශක පිළිවෙළින් සියයට 9.4 ක හා සියයට 18.9 ක වර්ධනයක් පෙන්නුම් කරමින් සමස්ත දර්ශකයේ වර්ධනයට ධනාත්මකව දායක විය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ පැවැති අඩු වෙළඳපොළ මිල ගණන් වලට ප්‍රතිචාර දක්වමින් රබර් කිරි කැපීමේ කටයුතු පහළ යෑම සහ පළමු භාගයේ අවසාන කාලයේදී පැවැති අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් රබර් උප දර්ශකයේ සියයට 12.8 ක කැපී පෙනෙන පහළ යෑමක් දක්නට ලැබුණි. 2018 වසරේ පළමු භාගය තුළදී පොල් උප දර්ශකය සියයට 5.3 කින් පහළ ගිය අතර තේ උප දර්ශකය සියයට 1.3 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. තවද, අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ධීවර කටයුතු සඳහා ඇති වූ බාධා මධ්‍යයේ වුවද ධීවර උප අංශය 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 0.6 කින් ඉහළ ගියේය.

**2.1 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශකය**

**(2007 - 2010 = 100)**

| අයිතමය | 2017 පළමු භාගය (අ) | 2018 පළමු භාගය (ආ) | වර්ධන වේගය (%) | |
|---|---|---|---|---|
| | | | 2016/17 (අ) | 2017/18 (ආ) |
| **කෘෂිකාර්මික සහ මත්ස්‍ය** | **118.1** | **133.8** | **-11.7** | **13.3** |
| **1. කෘෂිකර්මය** | **111.2** | **130.0** | **-15.6** | **16.9** |
| 1.1 කෘෂිකාර්මික භෝග | 103.7 | 122.9 | -19.6 | 18.5 |
| වී | 78.8 | 128.2 | -49.2 | 62.6 |
| තේ | 99.8 | 101.1 | 0.8 | 1.3 |
| රබර් | 67.2 | 58.6 | -5.9 | -12.8 |
| පොල් | 91.0 | 86.2 | -13.2 | -5.3 |
| අනෙකුත් භෝග | 137.8 | 163.8 | -9.6 | 18.9 |
| එයින්, එළවළු | 130.6 | 170.4 | -17.3 | 30.5 |
| පලතුරු | 164.0 | 176.3 | 12.5 | 7.5 |
| වෙනත් ක්ෂේත්‍ර භෝග | 136.5 | 176.2 | -18.6 | 29.1 |
| 1.2 පශු සම්පත් | 170.5 | 186.5 | 11.3 | 9.4 |
| **2. මත්ස්‍ය** | **151.6** | **152.5** | **5.7** | **0.6** |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### වී

- 2017 වසරේදී පැවති අහිතකර කාලගුණික තත්ත්වයන්ගෙන් අත්මිදෙමින් 2018 වසරේදී වී නිෂ්පාදනය පෙර වසර හා සැසඳීමේ දී සියයට 60 කින් පමණ ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කෙරෙන අතර, මෙම අස්වැන්න සමස්ත දේශීය ගෘහස්ථ සහල් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇතැයි අපේක්ෂිතය. 2017/18 මහ කන්නයේදී හා 2018 යල කන්නයේදී පැවති යහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් වසර තුළදී වී මෙට්‍රික් ටොන් මිලියන 3.8 ක් නිෂ්පාදනය කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, නියං තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් පෙර වසරේ මහ කන්නය හා සැසඳීමේදී, 2017/18 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.4 ක් දක්වා සියයට 62.6 කින් පමණ ඉහළ ගියේය. මේ අතර, එක්රැස් කරගන්නා ලද ජලය මගින් වගා කෙරෙන, 2018 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.4 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර එය පෙර වසරේ යල කන්නය හා සැසඳීමේ දී සියයට 56.8 ක ඉහළ යෑමකි. පවත්නා වී තොගය මගින් සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.4 ක් නිපදවීමට සමත් වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය මාස 12 ක පමණ දේශීය ගෘහස්ථ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත. 2017 වසරේදී ලද අඩු අස්වැන්න හා සහල් තොග අඩුවීම හේතුවෙන් වසර මුලදී දේශීය මිල ගණන් ඉහළ ගිය බැවින් සහල් ආනයනය දිරිමත් කිරීමට අදාළ පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට රජය පෙළඹිණි. 2018 පළමු මාස හය තුළදී ශ්‍රී ලංකාව එ.ජ. ඩොලර් මිලියන 100.1 ක මුළු වියදමින් සහල් මෙට්‍රික් ටොන් 239,519 ක් ආනයනය කර ඇත. නිෂ්පාදනය ඉහළ ගිය ද 2018 වසරේ පළමු භාගය තුළදී 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, තෝරාගත් වී හා සහල් ප්‍රභේද කිහිපයක මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි. 2018 වසරේ පළමු භාගය තුළදී විවෘත වෙළඳපොළෙහි සම්බා වී සඳහා වූ සාමාන්‍ය මිල 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී, කිලෝග්‍රෑමයකට රුපියල් 51.35 ක් දක්වා සියයට 6.8 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, නාඩු වී සඳහා වූ සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයකට රුපියල් 40.05 ක් වූ අතර එය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.1 ක පහත වැටීමක් විය. මේ අතර, සම්බා සහල් සඳහා වූ සාමාන්‍ය සිල්ලර

**2.3 රූප සටහන**
**වී නිෂ්පාදනය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිල ගණන් 2018 වසරේ පළමු භාගයේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 107.36 ක් වූ අතර, එය 2017 වසරේ එම කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 12.8 ක ඉහළ යෑමකි. නාඩු සහල් සඳහා වූ සාමාන්‍ය සිල්ලර මිල කිලෝග්‍රෑමයකට රුපියල් 93.26 ක් වූ අතර එය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 7.2 ක ඉහළ යෑමකි.


- 2016 යල කන්නයේ සිට ක්‍රියාත්මක වූ පොහොර සඳහා මුදල් ප්‍රදානය කිරීමේ වැඩසටහන වෙනුවට 2018 යල කන්නයේ සිට පොහොර සහනාධාර වැඩසටහන යළි හඳුන්වාදීමට රජය පියවර ගත්තේය. වී වගාව සඳහා කිලෝග්‍රෑම් 50 ක පොහොර මිටියක් රුපියල් 500 කට සහ තෝරාගත් අනෙකුත් භෝග කිහිපයක් සඳහා කිලෝග්‍රෑම් 50 ක පොහොර මිටියක් රුපියල් 1,500 කට ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. කෘෂි දේශගුණික කලාප හා වාරිමාර්ග යෝජනා ක්‍රම මත පදනම්ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන නිර්දේශ මත පොහොර සහනාධාරය නිකුත් කිරීම සිදු කරනු ලැබේ. 2018 වසරේ අප්‍රේල් මාසයේ උත්සව සමය තුළදී වෙළඳපොළෙහි ඇති විය හැකි සහල් හිඟය වළක්වාලීමේ ක්‍රියාමාර්ගයක් ලෙස රජය විසින් අඛණ්ඩව සහල් ආනයනය කිරීමට පියවර ගන්නා ලදී. කෙසේ වුවද, සහල් නිෂ්පාදනයට ප්‍රමාණවත් වී තොග දේශීය වෙළඳපොළෙහි පැවතීම හේතුවෙන්, 2018 වසරේ පළමු භාගයේ සහල් ආනයනය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 29.1 කින් පහත වැටුණි.

## තේ

- **2018 වසරේ පළමු භාගයේ දී සමස්ත තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 158.2 ක් වූ අතර එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 0.9 ක සුළු වැඩිවීමකි.** මැයි සහ ජුනි මාසවලදී තේ වගා කෙරෙන දිස්ත්‍රික්කවල පැවති වැසි සහිත කාලගුණික තත්ත්වය තේ දලු නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර එමගින් සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළදී තේ නිෂ්පාදනයෙහි වර්ධන ප්‍රවණතාවට බාධා ඇති විය. ඒ අනුව, සියලු තේ කාණ්ඩ සුළු වර්ධනයන් අත්පත් කර ගත් අතර සමස්ත තේ නිෂ්පාදනයට ඉහළම දායකත්වය සපයන පහත රට තේ නිෂ්පාදනය 2018 වසරේ පළමු භාගයේ දී කිලෝග්‍රෑම් මිලියන 97.7 ක් දක්වා සියයට 1.0 කින් වර්ධනය විය. මේ අතර අදාළ කාලපරිච්ඡේදය තුළදී උඩරට හා මැදරට තේ නිෂ්පාදනය සියයට 0.7 කින් වර්ධනය වෙමින්, පිළිවෙළින් කිලෝග්‍රෑම් මිලියන 36.1 ක් හා කිලෝග්‍රෑම් මිලියන 24.4 ක් දක්වා ඉහළ ගියේය. සමස්ත තේ නිෂ්පාදනය කෙරෙහි කුඩා තේ වතු අංශය විසින් ලබා දෙන දායකත්වය 2017 වසරේ පළමු භාගයේ දී පැවැති සියයට 73.8 ක මට්ටමේ සිට 2018 වසරේ පළමු භාගයේ දී සියයට 73.9 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

- **2018 වසරේ පළමු භාගය තුළදී කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල ගණන් පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී කිලෝග්‍රෑමයට රුපියල් 605.17 ක් දක්වා සියයට 2.2 කින් සුළු වශයෙන් පහළ ගියේය.** අදාළ කාලපරිච්ඡේදය තුළදී මැදරට තේ

**2.4 රූප සටහන**
**තේ නිෂ්පාදනය**




මූලය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඉහළම මිල පහළ යාම (සියයට 5.5) වාර්තා කළ අතර, උඩරට තේ මිල සියයට 2.9 කින්ද පහත රට තේ මිල සියයට 1.7 කින් ද පහළ ගියේය. මීට අමතරව, 2018 ජූලි මාසයේ දී කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල ගණන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කිලෝග්‍රෑමයකට රුපියල් 535.80 ක් දක්වා සියයට 9.6 කින් පහළ ගියේය. කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස හය තුළදී, තේවල සාමාන්‍ය අපනයන මිල ගණන්, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී පැවැති කිලෝග්‍රෑමයකට රුපියල් 796.34 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 828.13 ක් දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය. 2018 වසරේ පළමු භාගයේ දී කොළඹ තේ වෙන්දේසියට ඉදිරිපත් කළ තේ ප්‍රමාණය ද සියයට 3.4 කින් වර්ධනය විය. මේ අතර, 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව තේ අපනයන ආදායම ද සියයට 0.1 කින් සුළු වශයෙන් වර්ධනය විය.

### රබර්

- **තෙත් කලාපයේ රබර් වගා ප්‍රදේශයන්හි අඛණ්ඩව පැවති වැසි තත්ත්වය නිසා රබර් කිරි කැපීමේ දින ගණන අඩු වීම හේතුවෙන් රබර් ඵලදාව සැලකිය යුතු මට්ටමකින් පහළ ගියේය.** 2018 වසරේ පළමු භාගයේ දී රබර් නිෂ්පාදනය, 2017 අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 39.3 ක් දක්වා සියයට 12.8 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. සමස්ත රබර් නිෂ්පාදනයෙහි විශාලම උපකාණ්ඩය වන ෂීට් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 19.6 ක් දක්වා සියයට 12.8 කින් අඩු වූ අතර ක්‍රේප් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 6.9 ක් දක්වා සියයට 0.5 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, 2018 වසරේ පළමු භාගය තුළදී කේන්ද්‍රාපසරණය කරන ලද ලේටෙක්ස් රබර් සහ අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය ද කිලෝග්‍රෑම් මිලියන 12.8 ක් දක්වා සියයට 18.7 කින් පහළ ගියේය. 2018 වසරේ පළමු භාගය තුළ සාමාන්‍ය රබර් මිල ගණන් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පහළ මට්ටමක පැවැතිණි. 2018 වසරේ පළමු භාගයේ දී කොළඹ රබර් වෙන්දේසියේ නොම්මර 1 දුම් ගැසූ දාර සහිත ෂීට් රබර් (RSSI) කිලෝග්‍රෑමයක් සඳහා සාමාන්‍ය මිල රුපියල් 289.78 ක් දක්වා සියයට 12.6 කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, ලේටෙක්ස් ක්‍රේප් රබර් කිලෝග්‍රෑමයක් සඳහා වූ සාමාන්‍ය මිල රුපියල් 325.93 ක් දක්වා සියයට 4.4 කින් ඉහළ ගියේය.

### පොල්

- **2018 වසරේ පළමු භාගය තුළදී පොල් නිෂ්පාදනය 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව ගෙඩි මිලියන 1,220.2 දක්වා සියයට 5.3 කින් පහළ වැටෙණු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.** 2016 වසරේ අවසාන භාගයේ දී හා 2017 වසරේ මුල් කාලයේ දී පැවැති නියං තත්ත්වය මගින් පසුකාලීනව ඇති කරන ලද අහිතකර බලපෑම මෙම නිෂ්පාදනය පහළ යෑමට හේතු විය. එබැවින්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළදී පොල් ආශ්‍රිත නිෂ්පාදන රැසක නිෂ්පාදන පරිමා පහළ ගියේය. පොල් තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,851 ක් දක්වා සියයට 70.6 කින් පහළ ගිය අතර, දිසිදි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8,461 ක් දක්වා සියයට 48.5 කින් පහළ ගියේය. නොඉඳුල් පොල් තෙල් නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් 5,785 ක් දක්වා සියයට 16.7 කින් පහළ ගියේය. පොල් ගෙඩි නිෂ්පාදනය පහළ ගිය ද, 2018 වසරේ පළමු භාගයේ දී, පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි හා දියර පොල් කිරි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 32,909 ක් දක්වා සියයට 51.4 කින් ඉහළ ගියේය. සැපයුම පහළ යෑම හේතුවෙන් 2018 වසරේ දී වෙළඳපොළ පොල් මිල ගණන්හි තියුණු වැඩිවීමක් සිදු විය. 2017 වසරේ පළමු භාගය තුළදී රුපියල් 55.80 ක් වූ පොල් ගෙඩියක සාමාන්‍ය තොග මිල, 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී රුපියල් 71.58 ක් දක්වා සියයට 28.3 කින් ඉහළ ගියේය. ඊට සමානව, 2017 වසරේ පළමු භාගයේදී රුපියල් 61.71 ක් වූ පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල 2018 වසරේ පළමු භාගයේ දී ගෙඩියක් රුපියල් 77.61 ක් දක්වා සියයට 25.8 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 දෙසැම්බර් මාසයේ මිල ගණන් හා සැසඳීමේදී පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 83.42 සිට 2018 වසරේ ජූනි මාසයේ දී රුපියල් 76.83 ක් දක්වා සියයට 7.9 කින් පහළ ගියේය. පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන තුනෙහි සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස) 2017 වසරේ පළමු භාගයේ දී වූ ගෙඩියක් රුපියල් 53.15 ක සිට 2018 පළමු භාගයේ දී ගෙඩියක් රුපියල් 79.47 ක් දක්වා සියයට 49.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

### වෙනත් ක්ෂේත්‍ර භෝග

- **ප්‍රධාන වශයෙන් ම පැවති යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් 2017/18 මහ කන්නයේ වෙනත් ක්ෂේත්‍ර භෝග වගාවන් යථා තත්ත්වයට පත් වෙමින්**

**එහි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 429,289 ක් දක්වා සියයට 42.3 කින් ඉහළ ගියේය.** මෙම කන්නය තුළදී කව්පි, මුංඇට, කුරක්කන් හා අර්තාපල් වැනි භෝග නිෂ්පාදනය ඉහළ ගියේය. මෙම භෝග ආනයනය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, අර්තාපල් වැනි නිෂ්පාදන සඳහා ඉහළ මිල ගණන් හිමි වීම ද මේ සඳහා තරමක් දුරට උපකාරි විය. මේ අතර, 2018 වසරේ පළමු භාගය තුළදී බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 242,935 ක් දක්වා සියයට 48.4 කින් ඉහළ ගිය අතර එය ඇස්තමේන්තුගත දේශීය බඩ ඉරිඟු අවශ්‍යතාවයෙන් සියයට 50 කට වඩා වැඩි විය. තවද, උඳු හා කව්පි නිෂ්පාදනය මෙම වසරේ සමස්ත දේශීය අවශ්‍යතාවයෙන් සියයට 80 ක් පමණ සැපයීමට ප්‍රමාණවත් වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වුවද, පෙර වසර හා සැසඳීමේ දී වගා කරන ලද භූමි ප්‍රමාණය අඩුවීම හේතුකොටගෙන සෝයා බෝංචි සහ සෝගම් වැනි වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය අඩුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි.

### එළවළු

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 2017/18 මහ කන්නයේ සමස්ත එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 985,982 ක් දක්වා සියයට 20.6 කින් ඉහළ ගියේය.** මෙම වසරේ මුල් කාලයේදී ප්‍රධාන වශයෙන් එළවළු වගා කරන ප්‍රදේශයන්හි පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් වගා කරන ලද භූමි ප්‍රමාණය ඉහළ යෑම නිසා පහතරට එළවළු නිෂ්පාදනය සියයට 31.1 කින් හා උඩරට එළවළු නිෂ්පාදනය සියයට 20.8 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, මැයි මස මැද භාගයේ දී පැවැති අධික පෙර මෝසම් වැසි හේතුවෙන් පුත්තලම හා රත්නපුර දිස්ත්‍රික්කවල ගංවතුර තත්ත්ව ඇති වූ අතර එමගින් 2018 යල කන්නය සඳහා තවාන් මට්ටමේ පැවැති එළවළු වගාවන්ට ඇඩි හානි සිදු විය. තවද, 2018 මැයි මාසයේ දී දිවයින පුරා පැවති අධික වැසි සහිත කාලගුණික තත්ත්වය නිසා මුල් අවධියේ පැවැති උඩරට හා පහතරට එළවළු වගාවන්ට හානි සිදුවීමෙන් සැපයුම් තත්ත්වයන් පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2018 මැයි මාසයේ අග සිට එළවළු මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වුවද, ජූලි මස මැද වන විට වෙළඳපොළ වෙත ලැබුණු 2018 යල අස්වැන්න එළවළු මිල ගණන් පහළ යෑම සඳහා උපකාරී විය.

### සීනි

- **2018 වසරේ පළමු භාගය තුළදී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 22,858.8 ක් දක්වා සියයට 56.0 කින් ඉහළ ගියේය.** මෙය, අදාළ ප්‍රදේශයන්හි පැවති යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සෙවනගල කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය සියයට 299.2 කින් ඉහළ යෑමේ සහ නිසි කාලයේ අස්වනු නොලැබීමෙන් ගල්ඔය හා පැල්වත්ත කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය පිළිවෙළින් සියයට 59.8 කින් හා 11.6 කින් පහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. කෙසේ වුවද, උක් නිෂ්පාදනය ඉහළ නැංවීමේ අදහස ඇතිව, රජය විසින් උක් පර්යේෂණ ආයතනය හා එක්ව උක්වගාව ඉහළ නැංවීමට වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී. රජය විසින් ගනු ලබන විවිධ ප්‍රයත්නවල සහාය ඇතිව 2018 වසරේ සමස්ත සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50,802 ක් දක්වා සියයට 1 කින් පමණ සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත අතර එය රටෙහි සමස්ත සීනි අවශ්‍යතාවයෙන් සියයට 9 ක් පමණ වනු ඇත.

### ධීවර

- **ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවලට අනුව, 2018 වසරේ පළමු භාගයේ දී මුහුදු මත්ස්‍ය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඇතුළත් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 254,395 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** සමස්ත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 46 ක පමණ දායකත්වයක් සපයන අක්වෙරළ හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී මෙට්‍රික් ටොන් 101,180 ක් දක්වා සියයට 1.8 කින් ඉහළ ගියේය. මේ අතර, 2018 වසරේ මැයි මාසයේ දී ප්‍රධාන වශයෙන් වෙරළාශ්‍රිත ප්‍රදේශවල පැවති වැසි සහිත කාලගුණය හේතුවෙන් වෙරළ ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 119,360 ක් දක්වා සියයට 7.1 කින් පහළ ගියේය. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 13 ක පමණ දායකත්වයක් සපයන මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා උප අංශයේ නිෂ්පාදනය 2017 වසරේ පළමු භාගය හා සැසඳීමේ දී 2018 වසරේ පළමු භාගයේ දී සියයට 35.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මිරිදිය ජලාශයන්ට මත්ස්‍ය පැටවුන් මුදා හැරීම සහ ජලජීවී වගා අංශයේ දියුණුව මෙම උප අංශයේ වර්ධනය කෙරෙහි හේතු විය.

කෙසේ වුවද, 2018 වසරේ පළමු භාගය තුළදී මාළු සිල්ලර මිල ගණන් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ඉහළ මට්ටමක පැවතිණි.

## පශු සම්පත්

- **2018 වසරේ පළමු භාගයේ දී 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව පශු සම්පත් අංශයේ වර්ධනයක් දක්නට ලැබුණි.** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු හා පුරෝකථනවලට අනුව 2018 වසරේ පළමු භාගය තුළ දී සමස්ත කිරි නිෂ්පාදනය ලීටර මිලියන 241.2 ක් දක්වා සියයට 8.5 කින් ඉහළ ගිය අතර එය මුළු දේශීය ඉල්ලුමෙන් සියයට 40 ක් පමණ සැපිරීමට ප්‍රමාණවත් විය. 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සමස්ත කිරි නිෂ්පාදනයෙන් එළකිරි නිෂ්පාදනය සියයට 84.4 ක් වූ අතර ඉතිරිය මී කිරි නිෂ්පාදනයට අයත් විය. මේ අතර, 2017 වසරේ දී මාපිය සතුන් (Layer parents) ආනයනය ඉහළ යෑමත් සමඟ 2018 වසරේ පළමු භාගයේ දී බිත්තර නිෂ්පාදනය මිලියන 1,538 ක් දක්වා සියයට 25.2 කින් ඉහළ ගියේය. 2018 වසරේ පළමු භාගයේ දී කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 100,040 ක් දක්වා සියයට 7.7 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රධාන වශයෙන්, දිනක් වයසැති කුකුළු පැටවුන් මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2018 වසරේ පළමු භාගය තුළදී කුකුළු මස් නිෂ්පාදනය සඳහා වූ සාමාන්‍ය පිරිවැය ඉහළ ගියේය. 2018 වසරේ පළමු භාගයේ දී ඌරු මස් හා හරක් මස් නිෂ්පාදනය ද පිළිවෙළින් සියයට 32.9 කින් හා 2.4 කින් ඉහළ ගියේය. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පශු සම්පත් අංශයේ ප්‍රධාන සැලැස්ම මත පදනම්ව දියර කිරි අංශය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජානමය හැකියාවන් දියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ කිරි ගව සම්පත වැඩි කිරීම සඳහා පශු සම්පත් අභිජනන ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවන ලදී. වසංගත හා වෙනත් රෝග පාලනය යටතේ රට පුරා සතුන් එන්නත් කිරීම සමඟ රෝග විමර්ශනය හා රෝග නිරීක්ෂණ කටයුතු ද සිදු කරන ලදී. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලද ක්ෂේත්‍ර පශු වෛද්‍ය සේවා දියුණු කිරීමේ වැඩසටහන යටතේ පශු සම්පත් ගොවීන්ට සේවා සපයන ආයතන වැඩි දියුණු කිරීම මගින් පශු සම්පත් සංවර්ධනය සඳහා වූ ආයතනික සහාය ශක්තිමත් කරන ලදී.

## කර්මාන්ත

- **2018 වසරේ පළමු භාගයේ දී කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ සියයට 4.5 ක වර්ධනයට සාපේක්ෂව සියයට 1.6 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.** ඉදිකිරීම් කර්මාන්තයේ සහ පතල් හා කැණීම් කටයුතුවල දක්නට ලැබුණු පහත වැටීම කර්මාන්ත කටයුතුවල වර්ධනයට අහිතකර ලෙස බලපාන ලදී. මේ අතර, මෙම වසරේ පළමු භාගයේ දී නිෂ්පාදන කර්මාන්ත කටයුතු, 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයුම් ක්‍රියාකාරකම් මෙම වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ක්‍රියාකාරකම් සහ ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල වර්ධනයේ යම් මන්දගාමීත්වයක් පෙන්නුම් කරන ලදී.

- **කර්මාන්ත කටයුතු වාර්තා කළ අඩු වර්ධනය කෙරෙහි 2017 වසරේ පළමු භාගයේදී සියයට 3.6 ක වර්ධනයක් වාර්තා කරන ලද ඉදිකිරීම් කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී සියයට 1.8 කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය.** ඉදිකිරීම් කටයුතුවල සිදු වූ පහත වැටීම පිළිබිඹු කරමින් මෙම වසරේ පළමු භාගය තුළදී රටෙහි සමස්ත සිමෙන්ති උපයෝජ්‍යතාව සියයට 0.7 කින් අඩු වූ අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පරිමා දර්ශකය ද සියයට 3.6 කින් පහත වැටුණි. ඉදිකිරීම් කටයුතු සමඟ ඉහළ සහසම්බන්ධයක් පවතින පතල් හා කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් ද 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 16.7 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 0.4 ක අඩු වීමක් වාර්තා කරන ලදී. මේ අතර, නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය, 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 3.1 ක සීමිත වර්ධනයක් වාර්තා කරන ලදී. නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල මෙම මන්දගාමී වර්ධනය පිළිබිඹු කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය 2018 වසරේ පළමු භාගයේ දී සියයට 1.1 ක සුළු ඉහළ යෑමක් වාර්තා කරන ලදී.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මාසිකව ගණනය කරනු ලබන නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සමස්තයක් වශයෙන් ගත් කළ 2018 වසරේ පළමු භාගයේ දී නිෂ්පාදන කටයුතුවල මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය. සමස්ත නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු මෙම වර්ධනය සඳහා 2017 වසරේ පළමු භාගයේ දී වර්ධනයක් පෙන්නුම් නොකළ ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතු, 2018 වසරේ පළමු භාගය තුළ කෘෂිකාර්මික කටයුතු යථා තත්ත්වයට පත්වීමත් සමඟ සියයට 5.3 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් දායක විය. තවද, 2017 වසරේ පළමු භාගයේ දී සියයට 3.8 ක වර්ධනයක් වාර්තා කළ රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනයෙහි එකතු කළ අගය 2018 වසරේ පළමු භාගයේ දී සියයට 4.1 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2017 වසරේ පළමු භාගයේදී සියයට 13.7 කින් පහත වැටුණු අඟුරු හා ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී තවදුරටත් සියයට 22.0 කින් සැලකිය යුතු ලෙස අඩු විය. වෙනත් කර්මාන්ත ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය සැලකීමේදී විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ කටයුතු 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 2.4 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 6.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ක්‍රියාකාරකම් සහ ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදාහැරීම් කටයුතු 2017 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 8.7 ක සහ සියයට 10.8 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් සියයට 6.4 ක් සහ සියයට 1.9 ක් ලෙස සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය.

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්

### කාර්මික නිෂ්පාදන දර්ශකය[1]

- **කාර්මික නිෂ්පාදන දර්ශකය, 2017 වසරේ පළමු භාගයේදී මෙන්ම 2018 වසරේ පළමු භාගයේදී ද සියයට 1.1 ක සුළු වර්ධනයක් වාර්තා කළේය.** ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය, ඇඟලුම් නිෂ්පාදන, රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන සහ රබර් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන වැනි කාර්මික නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන උප කාණ්ඩ සුළු වර්ධනයක් පෙන්නුම් කළ ද, කුඩා කාණ්ඩ කිහිපයක නිෂ්පාදනය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් සමස්ත වර්ධනය සියයට 1.1 කට සීමා විය. දේශීය වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීමට ඉහළ දායකත්වයක් දක්වන ආහාර ද්‍රව්‍ය, බීම වර්ග හා ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදන කාණ්ඩවල වර්ධනය සීමා වීමට ගෘහස්ථ ඉල්ලුම ඉහළ නොයෑම බලපෑවේය.


- **කාර්මික නිෂ්පාදන දර්ශකයේ තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් අයත් වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන අංශය, පසුගිය වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 2.4 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.** තේ නිෂ්පාදනය හැර මෙම කාණ්ඩයේ ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන්ම රඳා පවතිනුයේ ගෘහස්ථ පරිභෝජන ඉල්ලුම මතය. එබැවින්, පාරිභෝගික ඉල්ලුම සීමාවීම නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථ වර්ධනයට හේතු වූවා විය හැකිය. පළමු මාස හය තුළදී ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන යටතේ මස් ආශ්‍රිත නිෂ්පාදන, ටින් මාළු, කිරිපිටි, ජෑම් හා සෝස්, අයිස්ක්‍රීම් හා අයඩින් ලුණු ඇතුළු කාණ්ඩවල වර්ධනයක් වාර්තා විය. 2018 වසරේ පළමු භාගයේදී තිරිඟු පිටි නිෂ්පාදනය සහ සහල් නිෂ්පාදනය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී වර්ධනය විය.

- **කාර්මික නිෂ්පාදන දර්ශකයේ දෙවන විශාලතම කාණ්ඩය වන ඇඟලුම් නිෂ්පාදන අංශය 2017 වසරේ පළමු භාගයේ වාර්තා කළ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2018 පළමු භාගයේ දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කළේය.** එහෙත් විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්) නැවත ස්ථාපිතව පැවතිය ද ඇඟලුම් ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වී නොමැත. ජී.එස්.පී. ප්ලස් සහනය ක්‍රියාත්මක කාලසීමාව ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලංකාව වෙනත් අගය එකතු කළ කර්මාන්ත ගොඩනැංවීමේ ඇති හැකියාව ද වර්ධනය කළ යුතු බව මෙමගින් පෙන්නුම් කෙරේ. 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සියයට 1.5 ක වර්ධනයක් වාර්තා කළ රෙදිපිළි නිෂ්පාදන අංශය 2018 වසරේදී සියයට 1.7 කින් පහළ ගියේය.

1 කාර්මික නිෂ්පාදන දර්ශකය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබයි. එහි පදනම් වර්ෂය 2015 වන අතර ජාත්‍යන්තර සම්මත කාර්මික වර්ගීකරණය (4 වන සංශෝධනය) අනුව වර්ගීකරණය කර ඇත. මෙතෙක් භාවිතා කරන ලද කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය වෙනුවට නිෂ්පාදන ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය භාවිතා කරනු ලැබේ.

2

**2.5 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය 2017 වසරේදී වාර්තා කළ ඉහළ නිෂ්පාදනයට සාපේක්ෂව, 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 5.3 කින් පහළ ගියේය.** මෙම කාණ්ඩයට සිමෙන්ති, පෝසිලේන් හා සෙරමික් නිෂ්පාදන, වීදුරු නිෂ්පාදන, පිඟන් මැටි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කොන්ක්‍රීට් හා බදාම සැකසුම් ඇතුළු අනෙකුත් නිෂ්පාදිත අඩංගු වේ. 2018 වසරේ පළමු භාගයේ දී පෝසිලේන් නිෂ්පාදිත, වීදුරු බෝතල්, සෙවිලි උළු හා රැළි තහඩු නිෂ්පාදන, 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේදී සිමෙන්ති නිෂ්පාදනයේ ද, සුළු අඩුවීමක් පෙන්නුම් කළේය. 2018 පළමු කාර්තුවේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් පහළ යෑම ඉදිකිරීම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය පහළ යෑමට හේතු විය.

- **2017 වසරේ පළමු භාගයේදී සියයට 14.5 ක පහළ යෑමක් පෙන්නුම් කළ අඟුරු හා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනය, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 3.9 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.** 2017 වසරේදී මෙහෙයුම්වලට ඇති වූ බාධා හේතුවෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ක්‍රියාකාරකම් තාවකාලිකව නැවැත්වීමට සිදු වූ අතර කාර්යක්ෂමතාවය වැඩි කිරීමේ අරමුණින් සැලසුම් කරන ලද අලුත්වැඩියා කටයුතු 2018 වසරේ පළමු භාගයේදී ද සිදු විය.

- **රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී පැවති සියයට 2.4 ක වර්ධනය හා සැසඳීමේදී 2018 වසරේ පළමු භාගයේ දී සියයට 1.9 ක වර්ධනයක් වාර්තා කළේය.** මෙමඟින් ජාත්‍යන්තර වෙළඳපොළේ රබර් සඳහා පැවැති මිල ගණන් පහළ යෑම හා ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය අඩුවීම හමුවේ රබර් අපනයන ඉලක්ක කර ගත් රබර් නිපැයුම් කර්මාන්තයෙහි ද මන්දගාමීත්වයක් පෙන්නුම් කරයි. 2018 වසරේ පළමු භාගයේ දී රබර් ටයර්, අත් වැසුම්, ෂීට් රබර් වර්ග හා ක්‍රේප් රබර් නිෂ්පාදන මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය.


- **රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන, 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 15.3 ක පහළ යෑමට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේදී සියයට 7.1 ක වර්ධනයක් වාර්තා කළේය.** මෙම උප කාණ්ඩයට පොහොර, පළිබෝධනාශක, තීන්ත, වාර්නිෂ්, මුද්‍රණ තීන්ත, සබන්, සේදුම්කාරක, සනීපාරක්ෂක තුවා, ගිනිකූරු, සුවඳ විලවුන්, ප්‍රාථමික ප්ලාස්ටික් නිෂ්පාදන ආදිය ඇතුළත් වන අතර, මෙය නොයෙක් වර්ගවල කර්මාන්ත රැසකින් යුක්තවීම හා පාරිභෝගික ඉල්ලුම් සාධකවල පවතින වෙනස්කම් හේතුවෙන් සාමාන්‍යයෙන් ඉහළ විචලනයන්ගෙන් සමන්විත වේ. මෙම කාලපරිච්ඡේදයේදී පොහොර නිෂ්පාදනය පහළ ගියේය. මේ අතර, තීන්ත, සනීපාරක්ෂක තුවා, සේදුම්කාරක, පොලිතීන් මලු හා පොලිතීන් රෝල් නිෂ්පාදනය ඉහළ ගියේය. රට තුළ පරිහරණයට ගැනෙන පොලිතීන් ප්‍රමාණය සීමා කිරීමට ගත් වැඩපිළිවෙළෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිවී නොමැති බව මෙම අවසන් නිෂ්පාදන දෙකෙහි වර්ධනය මගින් පිළිඹිබු කෙරේ.

- **බීර හා අරක්කු නිෂ්පාදනය ඉහළ යෑම හේතුවෙන් බීම වර්ග නිෂ්පාදනය 2017 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 5.1 ක අඩුවීම හා සැසඳීමේදී 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී සියයට 6.1 ක වර්ධනයක් පෙන්නුම් කළේය.** දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය මීට ප්‍රතිවිරුද්ධ හැසිරීමක් පෙන්නුම් කරමින් 2017 වසරේ පළමු භාගයේදී වාර්තා වූ සියයට 3.9 ක පහළ යෑමට සාපේක්ෂව, සිගරට් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් සියයට 7.4 ක අඩුවීමක් වාර්තා කරමින් අඛණ්ඩව පහළ ගියේය.

- **2017 වසරේ පළමු භාගයේදී පිළිවෙළින් සියයට 9.5 ක් හා සියයට 7.2 ක් ලෙස වර්ධනය වූ මූලික ලෝහ වර්ග නිෂ්පාදනය සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය 2018 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් සියයට 11.4 ක හා සියයට 14.6 ක වර්ධනයක් පෙන්නුම් කළේය.** මූලික ලෝහ වර් නිෂ්පාදන අංශයේ ඉහළ වර්ධනයට ඊයම් හා ඇලුමිනියම් ආශ්‍රිත නිෂ්පාදන ඉහළ යෑම හේතු වූ අතර පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනයේ ඉහළ යෑමට ඇලුමිනියම් හා වානේ නිපැයුම් වැඩිවීම හේතු විය.

**2.6 රූප සටහන**

**කාර්මික නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික වෙනස්වීමට දායකත්වය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **2018 වසරේ පළමු භාගය තුළදී කුඩා පරිමාණයේ කාණ්ඩ දෙකක් වන සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන උප අංශය සියයට 3.4 ක වර්ධනයක් සහ දැව ආශ්‍රිත නිෂ්පාදන (ගෘහ භාණ්ඩ හැර) උප අංශය සියයට 13.5 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.** පළමු කාණ්ඩයේ වර්ධනයට මලු හා කබා ආදී සම් නිෂ්පාදන ඉහළ යෑමද අනෙක් කාණ්ඩයේ වර්ධනයට දැව මෝල් වල ලී සැකසුම් සහ දුම්රිය සිල්පර කොට හා තුනී ලෑලි නිෂ්පාදන ඉහළ යෑමද හේතු විය.

- **කාර්මික නිෂ්පාදන දර්ශකයේ සියයට 2 ක වඩා අඩු දායකත්වයක් සහිත තවත් උපකාණ්ඩ හයක නිෂ්පාදනය පහළ වැටුණි.** කඩදාසි හා කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය (සියයට 17.2 කින්), මූලික ඖෂධ නිෂ්පාදන සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් (සියයට 13.0 කින්), විදුලි උපකරණ නිෂ්පාදනය (සියයට 13.2 කින්) හා ගෘහ භාණ්ඩ නිපදවීම (සියයට 10.2 කින්) ආදි කාණ්ඩ බොහොමයක සැලකිය යුතු අඩු වීමක් විය. අභ්‍යාස පොත්, පුවත්පත්, මුදල් නෝට්ටු, ඇතැම් ඖෂධ කරල් වර්ග හා ආයුර්වේද පාන වර්ග, ගෘහස්ථ විදුලි උපකරණ, වයර්, මෙට්ට, දැව භාණ්ඩ හා වතුර පොම්ප ආදී වූ ද්‍රව්‍ය නිෂ්පාදනය අඩුවීම මෙම අයහපත් ප්‍රතිඵලයට දායක විය.

- **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය විසින් කර්මාන්ත කලාප සංවර්ධනය, රෙගුලාසි සම්පාදනය සහ ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම හරහා කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය උදෙසා සහාය ලබා දෙන ලදී.** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශයන්ට අනුව රජය විසින් නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය උසස් තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමේ දී පනවා තිබූ වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් සියයට 75 ක සහනයක් ලබා දීමට තීරණය කරන ලදී. මෝටර් රථ නිෂ්පාදනය, එක්ලස් කිරීමට හා උපාංග නිපදවීමට සහාය දීම සඳහා සහ එම අංශය වෙත විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටියක් සැකසීමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය කටයුතු කළේය. තවද, ඉන්දියානු ආයෝජන අපේක්ෂාවෙන් උතුරු පළාතේ අච්චුවේලි කාර්මික කලාපය පුළුල් කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සැලසුම් කර ඇත. මේ අතර, ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2018 මැයි මාසයේදී ආයෝජන සඳහා අවශ්‍ය සියලු පහසුකම් එක් ස්ථානයකින්ම ලබාගැනීමට සැලසීමේ කාර්යසාධන බලකාය (Single Window Investment Facilitation Taskforce) මගින් වෙබ් ද්වාරය ආරම්භ කරන ලදී. 2018 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් බිංගිරිය, මාවතගම, මිල්ලනිය හා වාලි මවුන්ට් වත්ත යන අපනයන සැකසුම් කලාප හතර ආශ්‍රිත සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී. 2018 වසරේ මැද වනවිට අපනයන සැකසුම් කලාපයන්හි රැකියා අවස්ථා 6,500 ක් පමණ ඇති බවද එයින් අඩක් යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා වන පුරප්පාඩු ලෙස ද හඳුනා ගෙන ඇති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කර්මාන්ත අංශයේ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟින් කුසලතා සංවර්ධනය කිරීමේ කාර්යසාධන බලකාය පිහිට වූ අතර එමගින් කම්හල් සේවකයින්ගේ සමාජ පිළිගැනීම ඉහළ නැංවීමට සහ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමඟ එක්ව දිවයින පුරා රැකියා සල්පිල් පැවැත්වීමට ද කටයුතු කර ඇත.

- **තවත් අමාත්‍යාංශ කිහිපයක්, රාජ්‍ය ආයතන හා කර්මාන්ත මණ්ඩල, නිෂ්පාදන අංශයට සහාය දැක්වීම අඛණ්ඩව සිදු කරන ලදී.** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය මගින් සම්පාදනය කළ මූලික විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිපත්තිය, ජාන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ජාතික ජාන දත්ත ගබඩාව සඳහා ක්‍රියාකාරී සැලැස්ම මගින් ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීමට සහාය වනු ඇත.

2

තවද, රට තුළ වෘත්තිය පුහුණුව වැඩි දියුණු කිරීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ප්‍රදේශයේ විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට අවශ්‍ය ඉඩම් පවරා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත. කාර්මික තාක්ෂණ ආයතනය විසින් ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ට නිපදවීමට හා අලෙවි කිරීමට හැකි නිෂ්පාදන වැඩි දියුණු කිරීමට තාක්ෂණ හුවමාරු වැඩසටහන් පවත්වන ලදී. මේ අතර, ජාතික විද්‍යා පදනම විසින් ශිෂ්‍යත්ව කිහිපයක් ප්‍රදානය කළ අතර නව නිෂ්පාදන හඳුන්වාදීමේ මූලාරම්භයන්වල නියුතු පර්යේෂකයන්ට ප්‍රදාන ලබාදීමට කටයුතු කළේය. මේ අතර, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් රට තුළ කාන්තා ව්‍යවසායකත්වය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී. ස්ත්‍රී ශ්‍රම සහභාගීත්වය වැඩි කිරීමේ අරමුණු පෙරදැරිව දිවයින පුරා දිවා සුරකුම් මධ්‍යස්ථාන 2,000 ක් ස්ථාපනය කිරීමට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති කර්මාන්ත මණ්ඩල හා සමාගම් රැසක් ද විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් නිෂ්පාදන අංශයට සහයෝගය දැක්වීමට හා රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති සම්පාදනයට දායක විය. රබර් නිෂ්පාදන සමාගම්, අපනයන සංවර්ධන මණ්ඩලය, ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය හා විදේශීය උපදේශකයින් විසින් අගයදාම සංවර්ධනය උදෙසා සහයෝගයෙන් කටයුතු කිරීම සහ අපනයන විභවතාව වැඩි දියුණු කිරීම සඳහා “ලංකා රබර් ගෝලීය සංසදය” නමින් විශේෂ අවශ්‍යතාවයන් සඳහා වන ඒකකයක් පිහිටුවන ලදී. වාණිජ නීති හා භාවිතයන් සංවර්ධනය පිළිබඳ ආයතනයේ හවුල්කාරීත්වය සමඟ ලංකා වාණිජ මණ්ඩලය විසින් අධිකරණයෙන් පරිබාහිරව වාණිජ ආරවුල් නිරාකරණය කිරීම සඳහා පිහිටුවීමට පහසුකම් සැලසීමට “ලංකා වාණිජ මණ්ඩල සහ වාණිජ නීති හා භාවිතයන් සංවර්ධන පිළිබඳ ආයතනයේ විකල්ප ආරවුල් විසඳීමේ මධ්‍යස්ථානය” පිහිටුවන ලදී.

### සේවා

- **ආර්ථිකයට විශාලතම දායකත්වය සපයන සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතු කළ අගය 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද සියයට 3.5 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 4.8 කින් වර්ධනය විය.** මූල්‍ය සේවා, තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතු සහ වෙනත් පෞද්ගලික සේවා කටයුතුවල අඛණ්ඩ වර්ධනය මේ සඳහා මූලික වශයෙන් දායක විය. තවද, දේපළ වෙළඳාම් කටයුතු, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීමේ සේවා, රක්ෂණය, විදුලි සංදේශ සේවා, වෘත්තීයමය සේවා, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනික සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල වර්ධනයද සේවා කටයුතුවල වර්ධනය සඳහා ධනාත්මකව දායක විය. කෙසේ වුවද, රාජ්‍ය පරිපාලන සේවා සහ ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු මෙම වසරේ පළමු භාගයේ දී පහත වැටුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව සම්පාදනය කරනු ලබන සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අනුවද 2018 වසරේ පළමු භාගය තුළදී සේවා ආශ්‍රිත සමස්ත ආර්ථික කටයුතුවල වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

### වෙළඳාම, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා

- **තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය හා ගබඩාකරණය සහ නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ සේවා කටයුතුවල එකතු කළ අගය 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද සියයට 2.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 4.0 කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා, තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 5.3 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා ගබඩා පහසුකම් සැපයීමේ කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 0.1 ක ඉතා සුළු වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 1.8 කින් වර්ධනය විය. කෘෂිකාර්මික නිෂ්පාදන යථා තත්ත්වයට පත්වීමෙන් ඇති වූ ධනාත්මක බලපෑම තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු සහ ප්‍රවාහන සේවා වර්ධනය වීම කෙරෙහි හිතකර ලෙස දායක වන්නට ඇත. තවද, නවාතැන් සැපයීම හා ආහාර පාන සැපයීමේ සේවා ආශ්‍රිත කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 7.0 ක හිතකර වර්ධනයක් වාර්තා කරන ලද අතර තැපැල් හා කුරියර් සේවා ආශ්‍රිත කටයුතු 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 6.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 5.7 කින් වර්ධනය විය.

### තොරතුරු සහ සන්නිවේදනය

- **තොරතුරු සහ සන්නිවේදන කටයුතුවල එකතු කළ අගය 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 9.5 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 9.8 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මේ සඳහා, විදුලි සංදේශ සේවා 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 10.5 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 12.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, පරිගණක වැඩසටහන්, මෘදුකාංග නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත සේවා 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සියයට 6.7 කින් වර්ධනය විය. කෙසේ වුවද, ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 22.1 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 16.8 කින් පහත වැටුණි.

### මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

- **මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 8.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මේ සඳහා, ප්‍රධාන වශයෙන් මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවල වර්ධනය දායක විය. ඒ අනුව, මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා සහ ඒ ආශ්‍රිත වෙනත් සේවා 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 10.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 12.2 කින් වර්ධනය විය. මේ අතර, නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම් කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 5.5 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 4.3 කින් වර්ධනය විය. තවද, රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී සියයට 10.2 කින් වර්ධනය වෙමින් මෙම ආර්ථික කටයුතුවල සමස්ත වර්ධනයට දායක විය.

### වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා

- **වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවාවල එකතු කළ අගය 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මේ සඳහා මූලික වශයෙන්, වෙනත් පෞද්ගලික සේවා, 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ එම කාලපරිච්ඡේදයේ දී සියයට 5.0 කින් වර්ධනය වීම හේතු විය. තවද, මෙම ආර්ථික කටයුතුවල සමස්ත වර්ධනයට දායක වෙමින් වෘත්තීයමය සේවා 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 2.0 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ අදාළ කාලයේ දී සියයට 3.0 කින් වර්ධනය විය.

### රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

- **රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2017 වසරේ පළමු භාගයේදී මෙන්ම 2018 වසරේ පළමු භාගයේ දී ද සියයට 0.5 ක ඉතා සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙම ආර්ථික කටයුතුවල වර්ධනය මන්දගාමී වීමට, රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව හා සමාජ ආරක්ෂණය ආශ්‍රිත කටයුතු 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 4.7 ක පහත වැටීමට සාපේක්ෂව, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 0.7 කින් තවදුරටත් පහත වැටීම හේතු විය. මේ අතර, සෞඛ්‍යය සේවා සහ අධ්‍යාපන සේවා 2017 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 11.9 ක සහ සියයට 3.6 ක වර්ධනයන්ට සාපේක්ෂව 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී පිළිවෙළින් සියයට 2.2 ක් සහ සියයට 1.7 ක් ලෙස සුළු වර්ධනයන් වාර්තා කරන ලදී.


### වියදම

- **පරිභෝජන සහ ආයෝජන වියදමෙන් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.) පවත්නා වෙළඳපොළ මිල අනුව 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 11.4 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 9.2 කින් වර්ධනය විය.** මේ සඳහා, ආයෝජන වියදමෙහි පසුබෑම හමුවේ වුවද පරිභෝජන වියදම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

ඒ අනුව, 2017 වසරේ පළමු භාගයේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව සියයට 6.0 කින් වර්ධනය වූ පරිභෝජන වියදම, 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 12.4 කින් වර්ධනය විය. මේ අතර, 2017 වසරේ පළමු භාගය තුළදී පවත්නා වෙළඳපොළ මිල අනුව සියයට 23.1 කින් වර්ධනය වූ ආයෝජන වියදම, 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 3.2 ක සීමිත වර්ධනයක් වාර්තා කරන ලදී. ආයෝජන වියදමෙහි දක්නට ලැබුණු මෙම මන්දගාමීත්වය, 2018 වසරේ පළමු භාගය තුළදී ඉදිකිරීම් කටයුතුවල එකතු කළ අගයෙහි දක්නට ලැබුණු පසුබෑමෙන් ද පිළිබිඹු වේ. මේ අතර, 2017 වසරේ පළමු භාගය තුළදී පවත්නා වෙළඳපොළ මිල අනුව සියයට 17.1 කින් පහත වැටුණු ශුද්ධ විදේශීය ඉල්ලුම මෙම වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සියයට 24.1 කින් තවදුරටත් පහත වැටුණි. මෙහිදී භාණ්ඩ සහ සේවා අපනයන, 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 11.6 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 11.8 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ ද, ආනයන 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 13.0 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සියයට 15.0 ක ඉහළ වේගයකින් වර්ධනය වීම ශුද්ධ විදේශීය ඉල්ලුම පහත වැටීමට හේතු විය. ඒ සමගම, ද.දේ.වි. සහ ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සමන්විත වන දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පවත්නා වෙළඳපොළ මිල අනුව 2017 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 11.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළදී සියයට 8.0 කින් වර්ධනය විය.

- ද.දේ.වි., 2017 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව වාර්තා කළ සියයට 11.7 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ දී රුපියල් බිලියන 15,602.3 ක් දක්වා සියයට 9.3 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ආයෝජන කටයුතුවල පුරෝකථනය කර ඇති පසුබැසීම හමුවේ වුවද පරිභෝජන වියදමෙහි අපේක්ෂිත ඉහළ යෑම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක වනු ඇත. මේ අතර, ශුද්ධ විදේශීය ඉල්ලුම පෙර වසරේ දී වාර්තා කරන ලද සියයට 9.5 ක පහත වැටීමට සාපේක්ෂව 2018 වසර තුළදී සියයට 17.9 කින් පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. මේ අනුව, පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. 2017 වසරේ දී වාර්තා කළ සියයට 11.8 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 8.7 ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2.7 රූප සටහන**
**ආර්ථිකයේ සමස්ත වියදම (ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## පරිභෝජනය

- ආර්ථිකයෙහි විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම 2017 වසරේ දී වාර්තා කළ සියයට 9.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව රුපියල් බිලියන 10,898.4 ක් දක්වා සියයට 16.0 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. පෞද්ගලික පරිභෝජන වියදම මෙන්ම රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම ද සමස්ත පරිභෝජන වියදම ඉහළ යෑම සඳහා දායකත්වය සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, පෞද්ගලික පරිභෝජන වියදම පවත්නා වෙළඳපොළ මිල අනුව 2017 වසරේ දී වාර්තා කළ සියයට 8.7 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 16.3 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2018 වසරේ පළමු භාගය තුළදී රාජ්‍ය පරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු ප්‍රවණතා මෙන්ම ඉදිරි කාලය සඳහා වන පුරෝකථන සැලකීමේ දී රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ දී තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.

## ආයෝජන

- **2018 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව ආයෝජන, 2017 වසරේ දී වාර්තා කළ සියයට 17.2 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.6 කින් පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කෙරේ.** වසරේ පළමු භාගයේ රාජ්‍ය වියදමෙහි ප්‍රවණතාව මෙන්ම ඉදිරි පුරෝකථන ද සැලකීමේ දී වසර තුළ රාජ්‍ය අංශයෙහි ආයෝජන කටයුතුවල යම් පසුබෑමක් අපේක්ෂා කෙරේ. තවද, සමස්ත ආයෝජනවලට ප්‍රධාන දායකත්වයක් දක්වන ඉදිකිරීම් කටයුතුවලට අදාළ පෞද්ගලික ආයෝජනවල මන්දගාමී වර්ධනය පිළිබිඹු කරමින් පෞද්ගලික නිවාස මිලදී ගැනීම්/ඉදිකිරීම්/අලුත්වැඩියා කිරීම් සඳහා පෞද්ගලික අංශය වෙත වාණිජ බැංකුවලින් ලබාදෙන ලද ණය ප්‍රමාණය 2018 වසරේ ජුනි මාසය අවසානය වන විට පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයෙහි වාර්තා කළ සියයට 22.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 14.6 ක අඩු වර්ධන වේගයක් වාර්තා කරන ලදී. ආයෝජන භාණ්ඩ ආනයනය සැලකීමේ දී, ආනයන පරිමා දර්ශක මගින් පිළිබිඹු වන පරිදි ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය 2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ සියයට 8.3 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළදී සියයට 3.0 කින් පහත වැටුණි. තවද, වසරේ පළමු මාස අට තුළදී, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයනය සුළු වර්ධනයක් පෙන්නුම් කළ අතර වෙනත් ආයෝජන භාණ්ඩ ආනයනය සැලකිය යුතු ලෙස පහත වැටුණි. මෙම ප්‍රවණතා මෙන්ම ව්‍යාපාර සමීක්ෂණ තුළින් පිළිබිඹු වන ව්‍යාපාර මතය අනුව ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස ආයෝජන වියදම 2017 වසරේ දී වාර්තා කළ සියයට 36.7 ට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 32.5 ක් දක්වා පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2.8 රූප සටහන**
**ආයෝජන සහ ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (අ)**




(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇස්තමේන්තු කරන ලද අගයයන්.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

- **ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘතිවලට ලැබුණු ණය ද ඇතුළුව ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති සඳහා ලද විදේශීය සෘජු ආයෝජන[2] සියයට 169.9 ක සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු භාගයේ දී ලද එ.ජ. ඩොලර් මිලියන 601.3 හා සැසඳීමේදී 2018 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,622.9 ක අගයක් වාර්තා කළේය.** යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට අදාළව වූ විදේශීය සෘජු ආයෝජන ගලාඒම් සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී ඩොලර් මිලියන 1,344.8 ක් දක්වා සියයට 386.2 කින් වර්ධනය විය. තවද, 2018 වසරේ පළමු භාගයේ සමස්ත විදේශීය සෘජු ආයෝජන ලැබීම්වලින් යටිතල පහසුකම්, නිෂ්පාදන හා සේවා පිළිවෙළින් සියයට 82.9, සියයට 7.7 ක් හා සියයට 9.4 ක් නියෝජනය කළේය.

## ඉතුරුම්

- **2018 වසරේ දී ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය මෙන්ම ජාතික ඉතුරුම් ද පෙර වසරට සාපේක්ෂව පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඒ අනුව, ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්, 2017 වසරේ පැවති සියයට 29.5 ක අගයට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 24.7 ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, රුපියල් වටිනාකම අනුව ගණනය කරනු ලබන ශුද්ධ ප්‍රාථමික ආදායම 2017 වසරට සාපේක්ෂව අඩු වේගයකින් පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, ශුද්ධ වර්තන සංක්‍රාම වැඩි වේගයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, ජාතික ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ දී වාර්තා කළ සියයට 34.0 ට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 29.4 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

2 මෙහි දක්වා ඇති විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත ලද ණයද ඇතුළුව වූ ලැබීම් වන අතර මෙම ඇස්තමේන්තු පස් වන පරිච්ඡේදයේ දක්වා ඇති අගයන්ගෙන් වෙනස් විය හැකිය. මෙවැනි වෙනසක් සඳහා පස් වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි වී නොමැති සමාගම් වෙත ලැබුණු සෘජු ආයෝජන ඇතුළත් වීම ප්‍රධාන වශයෙන් හේතු වේ.

2

## අපේක්ෂිත වර්ධනයන්

- **ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ පුරෝකථනය කර ඇති පරිදි ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වසරේ දී සියයට 4.5 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මකව දායක වනු ඇත. විදේශීය අංශය සැලකිමේදී වරණීය වෙළඳ ගිවිසුම් මගින් ආර්ථික වර්ධනයට ධනාත්මක බලපෑමක් ඇති වනු ඇති අතර, අපේක්ෂා කරන හිතකර ප්‍රතිපත්තිමය වර්ධනයන් තුළින් ව්‍යාපාරික පරිසරයේ ඇතිවන යහපත් ප්‍රවණතා මගින් දේශීය ආයෝජන සහ විදේශීය සෘජු ආයෝජන දිරිගැන්වෙනු ඇත. තවද, විදේශීය අංශයේ වර්ධනයන්ගෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ තවදුරටත් වැඩිකරගැනීම උදෙසා විදේශීය ඉල්ලුමෙහි අපේක්ෂිත වර්ධනයට මුහුණ දිය හැකි පරිදි ජාත්‍යන්තර වෙළඳපොලට ඉදිරිපත් කළහැකි අංශ වර්ධනය කිරීමෙන් අපනයන ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම අවශ්‍ය වේ.

- **2019 වසරේදී බොහොමයක් කෘෂිකාර්මික භෝග වල වර්ධනයන් වාර්තා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** දරුණු කාලගුණික තත්ත්වයන්ගෙන් බාධා ඇති නොවුණුහොත් 2019 වසරේදී සැලකිය යුතු වී අස්වැන්නක් අපේක්ෂා කෙරේ. ප්‍රධාන තේ වගා කරන ප්‍රදේශයන්හි පැවතිය හැකි අහිතකර කාලගුණික තත්ත්වයන්, ඉහළ යන නිෂ්පාදන පිරිවැය, ප්‍රධාන අපනයන ගමනාන්ත මත පැනවිය හැකි සම්බාධක වැනි අභියෝග සහ දේශීය වැවිලි අංශයෙහි සිදුවිය හැකි වැටුප් සාකච්ඡා වැනි අභියෝග මධ්‍යයේ 2019 වසරේදී තේ කර්මාන්තයෙහි මධ්‍යස්ථ වර්ධනයක් අපේක්ෂා කෙරේ. මේ අතර, රබර් මිල ගණන් පහළ මට්ටමක පැවතීම රබර් නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. කෙසේ වුවද, ඉහළ යන ජාත්‍යන්තර තෙල් මිල ගණන් මෙන්ම නැවත වගා කිරීම හා නව වගාවන් සඳහා ලබා දෙනු ලබන සහනාධාර ඉහළ නැංවීම සහ සම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට රබර් වගාවන් ව්‍යාප්ත කිරීම වැනි දේශීය රබර් නිෂ්පාදන ඉහළ නැංවීමට ගනු ලබන දිරිගැන්වීම් මගින් නිෂ්පාදනය ඉහළ නැංවීමට හැකි වනු ඇත. 2018 වසරේ මැද භාගයේ සිට පැවති පොල් නිෂ්පාදනය ඉහළ යෑමේ ප්‍රවණතාවය 2019 වසරේදී ද අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ විදේශීය ඉල්ලුම ද පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක වනු ඇත. මේ අතර, නීත්‍යානුකූල නොවන මත්ස්‍ය කටයුතු පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සහ නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතය වැනි මත්ස්‍ය සම්පත විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට ගත් ක්‍රියාමාර්ග 2019 වසරේදී මෙම අංශයේ නිෂ්පාදනය වර්ධනය වීමට දායක වනු ඇත. පශු සම්පත් අංශය සංවර්ධනය කිරීමට රජය මගින් ගනු ලැබූ නොයෙකුත් ක්‍රියාමාර්ග 2019 වසරේදී දියර කිරි සහ කුකුළු මස් කර්මාන්තවල නිෂ්පාදනය තවදුරටත් ඉහළ යෑමට දායක වනු ඇත. දේශීය කිරි නිෂ්පාදනය 2019 වසරේදී දේශීය අවශ්‍යතාවයෙන් සියයට 40 ක් සපුරා ලීමට ප්‍රමාණවත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර 2017 හා 2018 වසර වලදී කිකිළි පැටවුන් ලබා ගැනීමට අවශ්‍ය මාපිය සතුන් හා බ්‍රොයිලර් සතුන් නිපදවීමට අවශ්‍ය මාපිය සතුන් ආනයනය ඉහළ යෑම හේතුවෙන් බිත්තර හා කුකුළු මස් නිෂ්පාදනය ද ඉහළ වර්ධනයක් වාර්තා කරනු ඇත. කෘෂිකාර්මික සම්පත් වඩා හොඳින් කළමනාකරණය කිරීම, කාර්මික උපකරණ භාවිතය ඉහළ නැංවීම, නිෂ්පාදනවල තත්ත්වය වැඩි දියුණු කිරීම හා විදේශ වෙළඳපොළ ප්‍රවේශය මෙන්ම දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේද පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම තුළින් අනාගතයේදී වාණිජමය කෘෂිකාර්මික කටයුතුවලට යොමුවීම මගින් මෙම අංශයේ අනාගත වර්ධනය රඳා පවතිනු ඇත.

- **කර්මාන්ත ආශ්‍රිත කටයුතුවල යහපත් වර්ධනයක් 2019 වසරේදී අපේක්ෂා කෙරේ.** මෑත කාලීන වසරවලදී මන්දගාමී වූ නිෂ්පාදන අංශයේ වර්ධනය, වෙළඳපොළ ප්‍රවේශය වර්ධනය වීම සමඟ විදේශීය අංශයේ ඉල්ලුම ඉහළ යෑම සහ දේශීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම මගින් 2019 වසරේ සිට ක්‍රමයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. 2019 වසරේදී ජී.එස්.පී. ප්ලස් පහසුකම මගින් ඉල්ලුම් සපුරාලීමට ඇති හැකියාව වැඩිවීමත් සමගම ඇඟලුම් අංශය වාසි අත්කර ගැනීම මෙන්ම ආහාර, ඛනිජ තෙල් හා රබර් නිෂ්පාදනවලද පුළුල්වීමක් සිදු වනු ඇත. කෙසේ වුවද දැනට අඩු මට්ටමක පවතින වර්ධන වේගය වැඩි කිරීම සඳහා අගය එකතුකළ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාව ඉහළ නැංවිය හැකි ආයෝජන ප්‍රවර්ධනය කිරීමට ගනු ලැබූ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵල අත්කර ගැනීම අත්‍යවශ්‍ය වේ. තවද, මෙම ක්ෂේත්‍රයේ වර්ධනය

පවත්වාගෙන යෑමට වැඩි දියුණු කරන ලද නිෂ්පාදන, ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා හරහා විදේශීය වෙළඳපොළ ඉලක්කකර ගත යුතුය. මීට අමතරව, පුහුණු ශ්‍රම හිඟය, අමු ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහ ඉහළ බලශක්ති පිරිවැය ආදි ගැටලු සාර්ථකව විසඳා ගැනීම මත නිෂ්පාදන අංශයේ අනාගත ප්‍රගතිය රඳා පවතිනු ඇත. එබැවින්, විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මූල්‍යනය කිරීම මඟින් පසුගාමී සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම, සේවකයින් නැවත පුහුණු කිරීම හා පාසැල් හැරගිය සිසුන්ට වැඩමුළු පවත්වා පුහුණු ශ්‍රමිකයන් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කිරීම සහ දැනට සිටින සේවකයින් වෘත්තීය පුහුණුවට යොමු කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් රඳවා ගැනීම මඟින් නිෂ්පාදන අංශයේ වර්ධනයට සහාය වනු ඇත. මේ අතර, රජය මූලිකත්වය ගෙන ආරම්භ කළ ව්‍යාපෘති වන, කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය, හම්බන්තොට කර්මාන්ත කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ නව මගී පර්යන්තය, බස්නාහිර කලාප මහා නගර සැලැස්ම යටතේ වූ විවිධ ව්‍යාපෘති, දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම සහ පිටත වට රවුම් මාර්ගය වැනි ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කොට ඇති පරිදි ක්‍රියාත්මක වුවහොත් ආර්ථික වර්ධනය සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දායකත්වය ඉහළ යනු ඇත. තවද, නේවාසික හා වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම් වැනි පෞද්ගලික ඉදිකිරීම් කටයුතු ද, ඉදිකිරීම් කටයුතුවල අපේක්ෂිත වර්ධනය අත්කර ගැනීමට දායක වනු ඇත. එමෙන්ම, පතල් හා කැණීම් කටයුතු ද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය තුළින් ප්‍රතිලාභ ලබනු ඇත.

- **සේවා ආශ්‍රිත ආර්ථික කටයුතු 2019 වසරේ ආර්ථික වර්ධනය කෙරෙහි වැඩි දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** සේවා කටයුතුවල වර්ධනය කෙරෙහි, තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, මූල්‍ය සේවා, වෙනත් පෞද්ගලික සේවා, නවාතැන් සැපයීම, අධ්‍යාපනය හා තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවා වැනි සියලුම ප්‍රධාන සේවා කටයුතු පුළුල් ලෙස දායකවනු ඇතැයි පුරෝකථනය කෙරේ. ප්‍රධාන හා නැගී එන ආර්ථිකයන් සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යන යහපත් සම්බන්ධතා හා වරණීය වෙළඳ ගිවිසුම් හරහා වැඩි දියුණු කරගත් වෙළඳ සම්බන්ධතා විදේශ වෙළඳාමේ වර්ධනය කෙරෙහි දායකවනු ඇතැයි අපේක්ෂා කරන අතර එය තොග හා සිල්ලර වෙළඳාමේ වර්ධනයට ද ඉවහල්වනු ඇත. මේ අතර, විදුලි හා දෙමුහුන් බස්රථ ධාවනයට එක් කිරීම මගින් පොදු ප්‍රවාහන සේවා වැඩි දියුණු කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයෙන් ක්‍රියාත්මක කිරීම තුළින්, වඩාත් ගුණාත්මක ප්‍රවාහන සේවා සැපයීමෙන් පොදු ප්‍රවාහන සේවා භාවිතා කිරීමට මගීන් පෙළඹවීම, ප්‍රවාහන සේවා මගින් ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ යාමට හේතුවනු ඇත. තවද, සැලසුම් කර ඇති පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගීන් හැසිරවීමේ ධාරිතාවය වැඩි දියුණු කිරීමේ හා අභ්‍යන්තර ගුවන් තොටුපල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදුවුවහොත්, එය ප්‍රවාහන සේවාවල වර්ධනය කෙරෙහි මෙන්ම, සංචාරක සේවා ආශ්‍රිත කටයුතු වර්ධනයට ද දායක වනු ඇත. මීට අමතරව, ප්‍රධාන සංචාරක වෙළඳපොළවල් ඉලක්ක කර ගනිමින් ලොව පුරා දියත් කෙරෙන සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් මගින් ඉදිරියේදී වැඩි මුදලක් වැය කළ හැකි සංචාරකයන් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කරගත හැකිවනු ඇති අතර එය සංචාරක කටයුතු ආශ්‍රිත සේවාවල වර්ධනයට දායකවනු ඇත. මේ අතර, ආර්ථික ක්‍රියාකරකම්වල අපේක්ෂිත ඉහළ වර්ධනය, මූල්‍ය සේවා කටයුතුවල වර්ධන ප්‍රවණතාව තවදුරටත් පවත්වාගෙන යෑමට උපකාරී වනු ඇත. තවද, ශීඝ්‍රයෙන් වර්ධනය වන මැදි ආදායම්ලාභීන්ගේ නවීකරණය වූ ජීවන රටාව, ගුණාත්මක පෞද්ගලික සේවාවන් සඳහා වන ඉල්ලුම වැඩි වීමට හේතුවනු ඇති අතර එය වෙනත් පෞද්ගලික සේවා කටයුතුවල වර්ධනය කෙරෙහි දායක වනු ඇත. කෙසේ වුවද, මෙවැනි සංවර්ධන කටයුතු තුළින් හිතකර ප්‍රතිලාභ ඇතිකර ගැනීමට නම්, එම සංවර්ධන වැඩසටහන් නිසි කලට ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, රජයේ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම මෙහිදී ඉතා වැදගත් වේ.

- **පෞද්ගලික ආයෝජනවල අපේක්ෂිත වර්ධනයත් සමඟ, 2019 වසරේ දී සමස්ත ආයෝජන කටයුතු ධනාත්මකව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** රජය මූලිකත්වය ගෙන ආරම්භ කළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකවීම මෙන්ම ආයෝජකයන්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන ස්ථාවර ප්‍රතිපත්ති හේතුවෙන් පෞද්ගලික ආයෝජන මෙන්ම විදේශීය ඍජු ආයෝජන සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, දැනට ආරම්භ කර ඇති තට්ටු නිවාස හා වාණිජ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති පෞද්ගලික ආයෝජනවල වර්ධනයට දායක වනු ඇත.

2

- **ශ්‍රී ලංකාව ඉහළ වර්ධනීය මාවතකට අවතීර්ණ වීම සඳහා, ජාතික ඉතුරුම් ඉහළ නංවා ගැනීම මෙන්ම එය තිරසාර මට්ටමක පවත්වා ගැනීමත් අතිශයින්ම වැදගත් වේ.** මෙහිදී, මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්කයන්හි සඳහන් පරිදි රාජ්‍ය වියදම් කළමනාකරණය සහ ආදායම් වැඩිදියුණු කිරීම පිණිස ගනු ලබන විචක්ෂණශීලී උපාය මාර්ග මගින් රාජ්‍ය ඉතුරුම් ජනනය කිරීම සහ එය තිරසාර මට්ටමක පවත්වාගෙන යෑම මෙන්ම විදේශ ප්‍රේෂණ ඉහළ නැංවීමට පියවර ගැනීම ආර්ථිකයේ සමස්ත ඉතුරුම් ඉහළ නංවා ගැනීම සඳහා වැදගත් වේ. මෙය ඉහළ ආයෝජන වියදම් අවශ්‍යතාව මධ්‍යයෙහි වුවද ඉතුරුම් - ආයෝජන පරතරය කළමනාකරණය කිරීමට උපකාරී වනු ඇත.